දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna.

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජූනි
First Examination in Arts (External) 2013 – May/June 2015

# ආවිප්‍ර 1.2 - ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය
# EC 1.2 – History of Economics Development

**කාලය පැය තුන යි**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

01. i. ඉඩම් භුක්තිය හා ඒ වෙනුවෙන් සේවය සැපයීම පදනම් කොට ගත් දේශපාලන, සමාජ, ආර්ථික මෙන් ම සංස්කෘතික සංවිධාන ක්‍රමයක් ලෙස වැඩවසම් සමාජ ක්‍රමය කෙසේ විග්‍රහ කළ හැකි ද? යුරෝපා රටවල අත්දැකීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. නූතන යුරෝපයේ උදාව සනාථ කිරීමට ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කර, ඒවා පුළුල් විමර්ශනයට භාජනය කරන්න.

(ලකුණු 10)

02. i. කාර්මික විප්ලවය යුරෝපීය සමාජය කෙරෙහි ඇති කළ බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. කාර්මික විප්ලවයෙහි සමාජ - ආර්ථික ප්‍රතිවිපාක කවරේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

03. i. එංගලන්තය හැර සෙසු යුරෝපා රටවල වෘත්තීය සංගම් ව්‍යාපාරය මුල් අවස්ථාවේ දී අසාර්ථකත්වයට පත්වීම ප්‍රංශය, ජර්මනිය සහ රුසියාව යන රටවල අත්දැකීම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. වෘත්තිය සංගම් ව්‍යාපාරය එංගලන්තයේ සාර්ථකත්වයට ඉවහල් වූ සාධක කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

04. i. රුසියානු විප්ලවයට තුඩුදුන් හේතු සාධක කෙටියෙන් පැහැදිලි කොට එහි ප්‍රතිඵල දක්වන්න.

(ලකුණු 10)

ii. රුසියානු සමාජවාදී ජනරජය ගොඩ නැගීම සඳහා ලෙනින්ගෙන් ඉටුවූ කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

05. i. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේ 1832 දක්වා වූ දශක තුනක පමණ ආරම්භක කාලපරිච්ඡේදයේ දී ආර්ථිකයේ කිසිම අංශයක ස්ථිරසාර හෝ පුළුල් ප්‍රතිසංස්කරණ හඳුන්වා නොදීමට තුඩු දුන් හේතු කවරේ ද?

(ලකුණු 05)

ii. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කෝල්බෲක් - කැමරන් කොමිසම පත් කිරීමට පදනම් වූ පසුබිම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 05)

iii. කෝල්බෲක් කොමිසමේ ප්‍රතිසංස්කරණ යටතේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති කරන ලද වෙනස්කම් හා එහි බලපෑම පිළිබඳව විචාරාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 10)

06. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය සම්බන්ධව ප්‍රවණතා ප්‍රමාණාත්මක සංඛ්‍යා දත්ත ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07. i. "1850 - 1870 කාලසීමාව ශ්‍රී ලංකාවේ කෝපි යුගයේ ස්වර්ණමය අවධියයි" මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. "ශ්‍රී ලංකාවේ කෝපි ව්‍යාපාරය විනාශ වීමට මූලිකව හේතු වූයේ කෝපි කොළ රෝගය මිස මහා පරිහානිය නොවේ" 1870 ගණන් වලින් පසුව ශ්‍රී ලංකාවේ කෝපි වගාවේ අභාවයට තුඩු දුන් සාධක කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විචාරාත්මකව අගයන්න.

(ලකුණු 10)

08. i. "වැවිලි කර්මාන්තය සම්බන්ධව එතෙක් ක්‍රියාත්මක වූ විදේශ ඍජු ආයෝජන ප්‍රතිපත්තිය ඉංග්‍රීසි පාලන සමය යටතේ තවදුරටත් පවත්වා ගෙන ගිය ද, විදේශ ඍජු ආයෝජන පිළිබඳ ඉතා වැදගත් සන්ධිස්ථානයන් සනිටුහන් කරනු ලබන්නේ 1833 න් පසු ඉංග්‍රීසීන් විසින් හඳුන්වා දුන් නව ප්‍රතිසංස්කරණයන්ය" මෙම ප්‍රකාශය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 14)

ii. 1830 දශකයේ සිට ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ වන වගා ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයෙහි ඇති කරන ලද වෙනස්කම් පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 06)

oooooooooooooooooooooooooooooooooooooooo.